Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය

සතිය - 07
දිනය - ජූනි 21 - 25

ශ්‍රේණිය - 10

Prepared by - P.M.A.I. මුණසිංහ
කෑ/දෙහි/ආනන්ද කීර්ති විද්‍යාලය

දෙවන වාරය ඒකකය - 5 එන්ජිමක සිසිලන පද්ධතියේ ක්‍රියාකාරිත්වය ( පිටු අංක 101-115 )

1. තාප නිනාල සංසරණ ක්‍රමයේදී එන්ජිම තුළ ඇති සිසිලන ජලය රේඩියේටරය හරහා ගමන් කරනු ලබන්නේ

 i. ජල පොම්පය මඟින් ii. සංවහන ධාරා මඟින් iii. සන්නයනය මඟින් iv. රික්තය මඟින්

2. ජල සිසිලන පද්ධතියක පීඩනය වැඩි කිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?

 i. ජලයේ තාපංකය ඉහළ දැමීම ii. ජලය හොඳින් සංසරණය වීම
 iii. ජලය ඉක්මනින් සිසිල් වීම iv. ජලයේ හිමාංකය අඩු කිරීම

3. නවීන මෝටර් රථ වල භාවිත කර ඇති වඩාත් කර්යක්ෂම සිසිලන ක්‍රමය කුමක්ද?

 i. තාප නිනාල සංසරණ ක්‍රමය ii. පුඹුකය සහිත වාත සිසිලන ක්‍රමය
 ii. පුඹුකය රහිත වාත සිසිලන ක්‍රමය iv. කෘත පෝෂණ සංසරණ ක්‍රමය

4. අභ්‍යන්තර දහන එන්ජිමක ඉන්දන දහනය මඟින් ඇතිවන තාපයෙන් කොටසක් ශක්තිය බවට පරිවර්තනය වන අතර ඉතිරි තාපය මඟින් එන්ජිමේ උෂ්ණත්වය ඉහල දමයි.එය පාලනය කිරීම සඳහා සිසිලන පද්ධතියක් අවශ්‍ය වේ.

 I. එන්ජිම සිසිල් කිරීමේ ප්‍රධාන ක්‍රම සඳහන් කරන්න.
 II. ඔබ සඳහන් කළ සිසිලන ක්‍රම වල ඇති වාසි අවාසි දෙක බැගින් සඳහන් කරන්න.
 III. උෂ්ණත්ව පාලක වැල්වයේ ක්‍රියාකාරිත්වය කෙටියෙන් පැහැඩිලි කරන්න.
 IV. විකිරක පියනක රූප සටහනක් ඇඳ එහි ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

5. එන්ජිමක අඛණ්ඩ ක්‍රියා කාරීත්වය පවත්වාගෙන යාම සඳහා සිසිලන ක්‍රම භාවිතා කරයි.

 I. අභ්‍යන්තර දහන එන්ජිමක නිපදවන තාප ප්‍රමාණයෙන් 25% පමණ ප්‍රයෝජනයට ගනී. ඉතිරි තාප ශක්තිය ඉවත් කරනු ලබන ක්‍රම දෙකක් සඳහන් කරන්න
 II. එන්ජිමක ජල පොම්පයක අක්ෂ දණ්ඩ අසලින් ජලය කාන්දු වීම නිරීක්ෂණය කරන ලදී.එයට හේතුව සඳහන් කර එම දෝෂය නිවැරදි කිරීමට කළ යුතු කාර්යය කුමක්දැයි විස්තර කරන්න.
 III. පොම්ප ක්‍රමයේ ජල සිසිලන පද්ධතියක් සහිත එන්ජිමකවිකිරකයෙන් සිදු කරන කාර්යය පැහැදිලි කරන්න.